**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2019**

**------------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හා අංක 10 ට පටහැනිව මුදල් පදනම මත අයභාර හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු.2,247,500 ක් වූ ලැබිය යුතු පාඨමාලා ආදායම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහන් කරනු ලැබේ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව වියදම් උපචිත පදනම යටතේ දැක්වීමටත්, ආදායම මුදල් පදනම මත හඳුනා ගැනීමටත් කටයුතු කර ඇත. | ප්‍රමිතයට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය අනුව වත්කම අයත් දේපල පිරියත හා උපකරණ පන්තියම එකවර ප්‍රත්‍යාගණනය කල යුතු වුවද ඊට පටහැනිව ආයතනය සතු මෝටර් රථ 09 ක් අතුරින් එක් මෝටර් රථයක් පමණක් එම රථය රක්ෂණය කිරීමේදී ලබාගත් රු.4,300,000 ක තක්සේරුව පදනම් කරගෙන ප්‍රත්‍යාගණනය කර තිබුණි. ප්‍රමිතයේ 65 ඡේදය අනුව මෝටර් රථවල ඵලදායී ජීව කාලය පිළිබඳ නිසි ඇගයීමක් නොකිරීම නිසා | මෙම මෝටර් රථයේ පොත් අගය රු. මිලියන 9.5 කි. නමුත් වෙළඳපොල අගය රු.මිලියන 4.3 ක් පමණ වේ. එබැවින් වාර්ෂිකව ගෙවූ රු. 237,000 ක පමණ මුදලක් රක්ෂණ වාරිකය රු.131,000 ක් ලෙස අඩුකරගෙන ඇත. මෙමගින් ආයතනයට සිදුවූ ආර්ථික වාසිය රු.106,000 ක් වේ. අනෙකුත් මෝටර් රථද මෙම වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කෙරේ. | -එම- |

| | | |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ එහෙත් දැනටමත් භාවිත කරනු ලබන පිරිවැය රු.31,565,440 ක් වූ මෝටර් රථ 5 ක්ද ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබූ අතර මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරද නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය අනුව ආයතනයේ පවතින සියළුම මෝටර්රථ ඵලදායී ජීව කාලය නැවත ආගණනය කර නව ඵලදායී ජීව කාලයට අනුව ක්ෂයවීම් ගිණුම්වල පෙන්වීමට කටයුතු කර ඇත. කර ඇති ගැලපීම් ගිණුම්කරණ සටහන්වල ඇත. එම නිසා රු.31,565,440 ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ මෝටර්රථ ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි යන්න පිළිගත නොහැක. | |

## 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිගණක හා මෘදුකාංග වල ඵලදායී ජීව කාලය වර්ෂ 4 ක් ලෙස තක්සේරු කර ඒ අනුව ක්ෂය කර තිබුණු නමුත් එම ප්‍රතිපත්තියට පටහැනිව 2016 වර්ෂයේ මිලදී ගත් පිරිවැය රු.1,688,033 ක් වූ පරිගණක මෘදුකාංගවල ඵලදායී ජීවිත කාලය නිසි ඇගයීමකින් තොරව වර්ෂ 16 ක් ලෙස තක්සේරුකර ඒ අනුව සියයට 6.25 බැගින් ක්ෂය කර තිබුණි. | මෙහිදී 2016 වර්ෂයේ මිලදී ගත් පිරිවැය රු.1,688,033 ක් වූ පරිසණක මෘදුකාංග වසර 3 ක් ක්ෂය කිරීමෙන් පසුව ඵලදායී ජීව කාලය තවත් වසර 4 ක් බව නැවත ආගණනය කර ඇත. ඒ අනුව වත්කමෙහි තවදුරටත් ශුද්ධ පිරිවැය 25% ක අනුපාතය යටතේ ක්ෂය කර ගිණුම්වල සහ ගිණුම්කරණ සටහන්වල පෙන්වා ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කල යුතුය. |

## 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය පවත්වා තිබුණු පාඨමාලා වෙනුවෙන් රු.3,577,394 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. එම ප්‍රමාණය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණු අතර මෙම ලැබිය යුතු ශේෂය අයකර ගැනීම මතභේදයට තුඩුදී තිබුණි. | දිළිඳුකම පිටුදැකීම ව්‍යාපෘතිය යටතේ ලැබිය යුතු රු.3,577,304 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස ආයතනයේ පොත්වල ගිණුම්ගත කර ඇති අතර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පොත්වල ගෙවිය යුතු මුදලක් ලෙස සටහන් කිරීම එම අධිකාරියේ වගකීමකි. මේ පිළිබඳ කිහිපවිටකදී අධිකාරිය දැනුවත් කර ඇත. | ලැබිය යුතු බවට තහවුරු වූ අගය ගිණුම් තුල දැක්වීමට කටයුතු කල යුතුය. |

### 1.5.5 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාඨමාලා අවසන් කරන ලද සිසුන් 77 දෙනෙකුට අදාල රු.174,868 ක ආපසු ගෙවිය යුතු තැන්පතු වසර 3 ක් ගත වී තිබුණද ආපසු ගෙවා නොතිබුණි. | මෙම සිසුන් අතුරින් සිසුන් 20 දෙනෙකුගේ පාඨමාලා තවමත් අවසන් වී නොමැත. අනිකුත් සිසුන් 46 දෙනා සඳහා ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර මාස 03 ක කාලයක් ලබා දී ඇත. | තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කල යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2015 ජුනි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කල විගසම පියවිය යුතු වුවද අවස්ථා 26 කදී එකතුව රු.435,370 ක අත්තිකාරම් දින 20 සිට දින 62 දක්වා කාලයක් ප්‍රමාදව පියවා තිබුණි. | දින 14 ක කාලයක් තුල හෝ කාර්යය නිම වූ විගසම බිල්පත් සහ අත්තිකාරම් මුදල් ප්‍රතිපූරණය කල යුතු බවට කාර්යය මණ්ඩලය දැනුවත් කරන ලද අතර මින් ඉදිරියට මෙවන් අතපසුවීම් සිදු නොකිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා කෙටුම්පත් ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2018 අගෝස්තු 09 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. නමුත් 2019ජනවාරි සිට අප්‍රේල් දක්වා මුදල් වෙන් කරනු ලැබුයේ අතුරු සම්මත ගිණුම මගිනි. 2019 මැයි 01 සිට සම්මත වූ අයවැය අනුව ක්‍රියාකාරී සැලසුම සකස් කර මැයි මස | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත . | |
| (ඇ) | 2003 ජුනි 30 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | 2017 සහ 2018 වර්ෂවල විගණන වාර්තා ඇතුළත් වාර්ෂික වාර්තා විගණන දිනය වූ 2020 මැයි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවද සමඟ 2019 ජූලි 30 මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත භාර දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,111,440 ක ඌනතාවය ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.2,787,629 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,899,069 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෞද්ගලික පඩිනඩි වියදම රු.4,974,364 කින් හා සේවා ලබා ගැනීම් සඳහා ගෙවීම් රු.4,622,824 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනය 2016 ,හා 2018 වර්ෂවල අතිරික්තයන් වාර්තා කර තිබුණද 2015, 2017 වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ ඌනතාවයන් නිරීක්ෂණය විය. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය, ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී එය සියයට 100 කින් වැඩි වී රු.76,269,673 ක් වී තිබුණි .

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 සිට 2014 දක්වා කාලය තුල ආයතනයේ සේවකයින් 18 දෙනෙකුට වැටුප් වර්ධක හා දීමනා ලෙස රු.2,580,281 ක් වැඩිපුර ගෙවා තිබුණි. මින් සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් වහාම අයකර ගැනීමට කටයුතු නොකර මුදල් රෙගුලාසි 119 ට පටහැනිව විශ්‍රාම යන තෙක් රු.50 ත් රු.1,942 ත් අතර මාසික වාරිකවලින් අයකර ගැනීමට | එවකට ආයතනයේ සිටි සභාපතිවරයා සහ අධ්‍යක්ෂක මණ්ඩලය ලබාදුන් අනුමැතිය පරිදි එම වැටුප් වර්ධක ලබා දීම සිදුකර ඇත. 2009 වර්ෂයේ දී සිදු කරන ලද මෙම වැටුප් වර්ධක ලබා දීම 2014 වර්ෂය වනතුරු කිසිඳු විගණන විමසුමකට භාජනය වී නැත. එවකට සේවය කළ නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයාගෙන් අයවිය යුතු රු. 201,309 ක මුදල ගෙවා අවසන් කර ඇත. මෙම වැටුප් වැඩිකර ගෙවීම මෙම නිළධාරීන්ගේ වරදක් නොවන බැවින් | වැඩිපුර ගෙවූ වැටුප් එකවර අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල රු.1,481,781 ක් විය. දැනට සේවයේ නියුතු නොවන නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.227,652 ක් අයකරගෙන නොතිබුණි. | එවකට සිටි සභාපතිවරයාගේ උපදෙස් පරිදි දැනට සේවයේ නියුතු සේවකයින් විශ්‍රාම යනතෙක් වාරික වශයෙන් අඩු කිරීමට කටයුතු කර ඇත. | |
| (ආ) | අවශ්‍යතාවය සලකා බැලීමෙන් තොරව අත්තිකාරම් ලබාදීම නිසා අවස්ථා 11 කදී ලබාදී තිබූ රු.101,900 ක අත්තිකාරම් සම්පූර්ණ මුදලම හා අවස්ථා 35 කදී ලබාදී තිබූ රු.550,700 ක අත්තිකාරම්වලින් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් වැය නොකර ආපසු පියවා තිබුණි. | විවිධ විශේෂිත වූ කාරණා හේතුවෙන් සම්පූර්ණ අත්තිකාරම් මුදල ආපසු පියවීමට සිදු වී ඇත. | අවශ්‍යතාවය සලකා අත්තිකාරම් ලබාදීම කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලසුම් අනුව පර්යේෂණ අංශයෙහි ක්‍රියාකාරකම් 5 ක් සඳහා වෙන්කර තිබූ රු.3,400,000 කින් රු.646,000 ක් පමණක් වැයකර තිබුණු අතර එහි මූල්‍ය කාර්යසාධන ප්‍රතිශතය සියයට 7 සිට සියයට 35 දක්වා විය. පරිපාලන හා මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් 2 ක් සඳහා සැලසුම් ඉක්මවා වියදම් දරා තිබූ අතර එම ඉක්මවීමේ ප්‍රතිශතය සියයට 126 ක් හා 138 ක් විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව පර්යේෂණ අංශයෙහි ක්‍රියාකාරකම් 07 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන රු.මිලියන 9.72 කි. වැයකර තිබූ මුදල රු.මිලියන 7.23 කි. ප්‍රතිශතයක් වශයෙන් සියයට 74.4 කි. ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා වෙන්කල මුදලින් රු.මිලියන 4.565 ක් ආයතනය වෙත භාණ්ඩාගාරය ලබා දී නොතිබුණි. මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් වන කාර්යාල උපකරණ හා පර්යේෂණ උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණද සමස්ත ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව තුළ වියදම් කළමනාකරණය කර ඇත. | ක්‍රියාකාරී සැලස්ම ප්‍රායෝගික විය යුතු අතර එහි ඉලක්ක ළඟාකර ගැනීමට ආයතනය කටයුතු කල යුතුය. |

(ආ) ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය (2008–2031) සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) ව්‍යාපෘතිය සඳහා ආයතනයේ සිටින කාර්ය මණ්ඩලයට අමතරව සේවකයන් 22 ක් හා උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 2018 වර්ෂයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂයේ දී ද ඒ සඳහා බඳවා නොගෙන උපාධිධාරී පුහුණුවන්නන් 5 දෙනෙකු බඳවාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | ව්‍යාපෘති යෝජනාව අනුව ඇස්තමේන්තු වියදම රු.මිලියන 15.3 ක් වුවත් භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 04 ක සීමිත මුදල තුල උපදේශක වැටුප ගෙවීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම මත තනතුර සඳහා බඳවා ගැනීමට නොහැකි වී ඇත. ප්‍රතිපාදන ලද පසු නුදුරේදීම බඳවා ගැනීමට අපේක්ෂිතය. සෙසු තනතුරු සඳහා ලබා මාසික දීමනා රාජ්‍යානුබද්ධ සංවර්ධන ව්‍යාපෘතිවල පවතින වැටුප්/ දීමනා හා සසඳන කල ඉතාමත් අඩු මට්ටමේ විය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එම දීමනා වැඩි කිරීම සම්බන්ධයෙන් එකඟ නොවිය. 2020 වසර සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලද පසු බඳවා ගැනීමට අපේක්ෂිතය. විශ්ව විද්‍යාල වෙතින් උපාධි අපේක්ෂකයින් පුහුණුව සඳහා කෙරෙන ඉල්ලීම් සහ උපාධිධාරීන් රැකියා ගත පුහුණු සඳහා යෙදවීම හරහා පර්යේෂණ සඳහා දායකත්වය ලබා ගෙන ඇත. | අදාල කාර්යමණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) පළමු අදියර වූ 2017-2021 කාල සීමාව තුල දිස්ත්‍රික්ක 5 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 50 ක් තුල මැණික් නිධි ගවේෂණය කර සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 කට අදාල සිතියම් නිර්මාණය කර අවසන් වාර්තා නිකුත් කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 කට අදාල ගවේෂණ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. ආරම්භ කර තිබූ තවලම, පැල්මඩුල්ල, | භාණ්ඩාගාර ප්‍රතිපාදනවල හිඟකම සහ අවශ්‍ය අනුමැතීන්වල ප්‍රමාදය මත සුදුසු අය බඳවා ගත නොහැකි විය. මේ නිසා 2017-2019 කාලසීමාව තුළ ආයතනයේ සිටින ස්ථිර කාර්යය මණ්ඩලයෙන් එක් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියකු, පර්යේෂණ නිලධාරීන් 5 දෙනෙකු සහ ක්ෂේත්‍ර සහායක 3 දෙනෙකුගේ පමණක් සහාය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සිදුවීමෙන් අපේක්ෂා කල ඉලක්ක සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.<br>මේ වන විට කොට්ඨාස 10 ක කටයුතු අවසන් කර ඇති අතර | අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අකුරැස්ස හා ඇහැළියගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා මැණික් විභව සිතියම් සම්පූර්ණ කර නොතිබුණි. | මැණික් විභව සිතියම් 8 ක් නිර්මාණය කර ඇත. ජාතික ආර්ථිකය ඉහල දායකත්වය සැපයීම වෙනුවෙන් ඌන සහ සීමිත මානව සම්පත් උපයෝගී කර ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. | |
| | (iii) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර ව්‍යාපෘතිය තුලින් හඳුනාගෙන තිබූ මැණික් ඇතැයි සැලකෙන ප්‍රදේශ 05 ක නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමුකර තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය හරහා හඳුනාගත් මැණික් ඉඩම් වෙන්දේසි සඳහා වූ නියමු ව්‍යාපෘතියක් සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල වූ ඉඩම් 5 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කර ඇත. ස්ථාන නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් කර ඇති අතර නියමු ව්‍යාපෘතියට අදාල පතල් කැණීම් අධිකාරියේ වියදමින් සිදු කිරීමට නියමිතය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු.10,977,344 කට මිලදී ගත් විදුලි උදුනක් වර්ෂ 5 කට අධික කාලයක් නිෂ්කාර්යව තිබුණු අතර ඊට පසුව ප්‍රයෝජනයට ගෙන ආදායම් ඉපයීම් තත්ත්වයට පත්කර ගැනීම සඳහා 2018 හා 2019 වර්ෂවල රු.2,384,957 ක් වැයකර තිබුණි. උදුන ස්ථාපිත කර තිබූ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සතු ගොඩනැගිල්ලේ විදුලි පරිපථ සැකසීම් සඳහා ආයතනය දරා තිබූ රු.1,402,222 ක වියදම වර්ෂය අවසානය වන තෙක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | මෙය 2013 වසරේ මිලදී ගෙන තිබුණද රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ උදුනට අවශ්‍ය විදුලි සැපයුම නොමැති වූ බැවින් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා ගැනීමට නොහැකිව පැවතුනි. පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව රත්නපුර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පරිශ්‍රයෙන් ලබා දුන් ඉඩකඩක එම උදුන ස්ථාපනය කිරීමට අදාල කටයුතු සිදු කර ඇත. 2020 පෙබරවාරි 11 දින සිට එම උදුන ජනතා සේවයට යොදවා ඇති නිසා උදුනේ අපේක්ෂිත සේවාව ක්ෂේත්‍රයට ලබා දීමට හැකිව ඇත. | වත්කම් ඵලදායීව උපයෝජනයට අවශ්‍ය පියවර ගත යුතුයි. |
| (ඈ) | ජාතික විද්‍යා පදනමේ රු.10,481,088 ක මූල්‍යාධාර මත ක්‍රියාත්මක කර තිබූ අර්ධ මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීමේ වඩා සඵලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.3,132,048 ක් එනම්, | මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති වර්ෂය අවසන් වන්නේ දෙසැම්බර් 31 නොව අප්‍රේල් 21 ය. ව්‍යාපෘතිය සඳහා රසායන ද්‍රව්‍ය, ප්‍රෙෂර් වෙසල්(Pressure Vessel) මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. තාක්ෂණික සහකාර සහ කම්කරු තනතුරු | අපේක්ෂිත කාර්යසාධනය අත්කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 30 ක් වැයකර නොතිබුණු අතර 2020 අප්‍රේල් 21 වන විට නිමකල යුතු ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ මිලදී ගත යුතුව තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.1,130,000 ක් වූ Pressure Vessel යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදී ද මිලදී ගෙන නොතිබුණි. 2018 හා 2019 වර්ෂවල ඉටුකල යුතු Oiling, Impregnation, Waxing, Diffusion, Glass Filling සහ Bleaching යන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද සම්පූර්ණ කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහකාරවරයෙකු හා කම්කරුවෙකු බඳවා ගත යුතු වුවද එම සේවකයන් බඳවා නොගෙන පර්යේෂණ ශිෂ්‍යයෙකු පමණක් බඳවාගෙන තිබුණි. | සඳහා බඳවා ගත්තද ජාතික විද්‍යා පදනමෙන් වෙන්කර තිබූ දීමනා නොගැලපෙන බැවින් එම සේවකයන් සේවය හැර ගිය අතර නව සේවකයන් බඳවා ගැනීමටද නොහැකිව ඇත. කෙසේ නමුත් ව්‍යාපෘති කටයුතු ආයතනයේ සිටින සේවකයන් යොදවා අමතර ගෙවීම් නොකර සිදු කර ගැනීමට කටයුතු කර ඇත. | |
| (ඉ) ආයතනය විසින් වර්ෂය තුල සිසුන් 30 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ පාඨමාලාවක් පවත්වා නොතිබුණි. පාඨමාලා 6 ක් සඳහා 492 ක් වූ අපේක්ෂිත සිසු සංඛ්‍යාවට වඩා අඩුවෙන් බඳවාගෙන තිබුණු අතර එහි බඳවාගැනීම් ප්‍රතිශතය සියයට 42 සිට සියයට 68 අතර පරාසයක විය. | 2019 වර්ෂයේ වාත්තුකිරීම සහ විද්‍යුත් ලෝහාලේපනය පාඨමාලාව ආරම්භ කිරීමට සැළසුම් කර පැවතියද හදිසියේ ගොඩනැගිල්ලේ විදුලි සැපයුම ආශ්‍රිතව ඇති වූ ගැටළු මත පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි විය. ආභරණ සඳහා ගල් බැදීමේ පාඨමාලාව 2019 මැයි 30 වන දින ආරම්භ කිරීමට සැළසුම් කලද ප්‍රමාණවත් අයදුම්පත්‍ර ප්‍රමාණයක් නොලැබීමද පාස්කු ප්‍රහාරයද හේතුවෙන් පාඨමාලා තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගික විය යුතු අතර එහි ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සතු වාහන 2 ක් වර්ෂ 4 ක හා වර්ෂ 3 ක කාලයක සිට නිශ්ක්‍රීයව තිබුණි. | PB 7848 දරන වාහනය 2018 දී අපහරණයට මිල ගණන් කැඳවීමේදී තක්සේරු වටිනාකමට වඩා අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් වීම නිසා අපහරණය සඳහා කමිටුව මඟින් ප්‍රතික්ෂේප කරන ලදී. නැවතත් අපහරණය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ | වත්කම් විකිණීමට හෝ අපහරණය සඳහා කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | අනුමැතියට ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද විගස අපහරණ කටයුතු සිදු කරනු ලැබේ. QW 1185 දරණ ත්‍රී රෝද රථය අලුත් වැඩියා කර ආයතනයේ කෙටිදුර ගමන් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. | |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය ආරම්භ වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර තිබුණේ 2019 මැයි 3 දින වන අතර ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර ද නොතිබුණි. | 2019 කෙටුම්පත් ප්‍රසම්පාදන සැලැස්ම, කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව සමඟ 2018 අගෝස්තු 09 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. නමුත් අයවැය සම්මත වූයේ 2019 වර්ෂයේ මැයි 01 වෙනිදා සිට බව කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව ඇස්තමේන්තු ගත ප්‍රසම්පාදන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතු අතර නියමිත කාලය තුල ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මැණික් නිදර්ශක මිලදී ගැනීමට අයවැය මගින් රු.200,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද ඊට අදාල මිලදී ගැනීම් සිදුකර නොතිබූ අතර රු.1,100,000 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර රු.1,520,813 ක් වූ වත්කම් මිලදී ගෙන තිබුණි. | කාර්යාල උපකරණ සහ මැණික් ගල් සාම්පල අත්පත් කර ගැනීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් කාර්යාලයීය උපකරණ සඳහා රු. 1,520,000 ක මුදලක් වියදම් කර ඇත. ඒ අනුව ප්‍රතිශතය 138% කි. 2019 වර්ෂය සඳහා මැණික් ගල්සාම්පල මිලදී ගැනීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කලද කිසිදු සැපයුම්කරුවකු ලියාපදිංචි නොවීම මත කාර්යය සිදුකිරීමට නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය වූ 136 න් 56 ක් එනම්, සියයට 41 ක් පුරප්පාඩුව පැවතුණ අතර වර්ෂ 9 ක් පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා බඳවා ගැනීම විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩුව ඇති තනතුරු 56 ක් සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශය හරහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත. අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේ සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවූ බැවින් බඳවා ගැනීමට නොහැකි වී ඇත. අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |